**ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 71 වැනි සැසිවාරය අමතා කරන ලද කථාව**

**2016 සැප්තැම්බර් මස 21 වැනිදා**

**නිව්යෝර්ක්**

සුබ සන්ධ්‍යාවක් !

ඔබ සියලු දෙනාටම තෙරුවන් සරණයි!

ආයුබෝවන්!

වනක්කම් !

අස්ලාම් අලෙයිකුම්!

එක්සත් ජාතීන්ගේ 71 වැනි සමුළුවට, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විදිහට සහභාගී වීමට ලැබීම මා ඉතාමත්ම සතුටට පත්වෙන අවස්ථාවක්. ශ්‍රී ලංකාවේ නව පරිවර්තනීය යුගයක් ආරම්භ කරමින් ගෙවීගිය මාස විස්සක පමණ කාල සීමාව, අවශ්‍ය දේශපාලන, ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා අපි මූලිකත්වය දී තිබෙනවා. විශේෂයෙන්ම, මගේ රජය බලයට පත්වීමට පෙර, ශ්‍රී ලංකාව තුළ තිබූ බියෙන් සහ සැකයෙන් ජීවත්වීමේ සමාජ පසුබිම ඉවත් කරමින්, සතුටින්, නිදහසේ, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වන ජනතාවක් සඳහා අවශ්‍ය මූලික පදනම සකස් කරමින්, ඒ කටයුතු ශක්තිමත් කර තිබෙනවා. මගේ රජයේ අරමුණ, ශ්‍රී ලංකාවේ ජීවත්වන සියලු ජනතාව, ලෝකයේ ඉතාමත්ම සතුටින් ජීවත්වන රටවල් අතරින් එක් රටක් බවට පත් කිරීමයි. ඒ නිසා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමත්, ආර්ථික සමෘද්ධිය ඇති කිරීමත් තුළ, ප්‍රධාන වශයෙන් ලෝකයේ ශක්තිමත් ප්‍රබුද්ධ ජනතාවක් බවට පත් කිරීම මගේ රජයේ ප්‍රධාන අරමුණක් සහ අභිප්‍රායක්. ඒ වගේම දුගී භාවය අද මුලු ලෝකය පුරාම තිබෙන බරපතල අභියෝගයක් බැවින් 2017 ලබන වර්ෂය, ශ්‍රී ලංකාවේ දුගීභාවයෙන් නිදහස් වීමේ වර්ෂය ලෙස නම් කර තිබෙනවා. ආර්ථික සංවර්ධනය මුල් කරගත් රටක, ජනතාවගේ සියලු ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සකස් කිරීමේ කාර්යයට, ඒ අනුව මා ප්‍රමුඛත්වය දී තිබෙනවා.

ප්‍රධාන වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයත්, ඒ වගේම, අනෙකුත් සියලු ආයතනික රාජ්‍යයන් විසින් කටයුතු කිරීමේදී, ගරු සභාපතිතුමනි, ඒ වගේම ගෞරවනීය රාජ්‍ය නායකයනි, නෝනාවරුනි, මහත්වරුනි, අප සැමවිටම කැපවී සිටින්නේ, තිරසර

සංවර්ධනය ප්‍රමුඛතාවයේ ලා සමාජයට, රටට අවශ්‍ය වෙනස්කම් ඉටු කිරීමටයි. එහිදී, මූලික වශයෙන්ම, අවශ්‍ය ආර්ථික ජයග්‍රහණ ලබා ගැනීමට ප්‍රමුඛත්වයක් සැමවිටම අපි දී තිබෙනවා. පරිසර සංරක්ෂණය, ඒ වගේම, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කී-මූන් මැතිතුමා විසින් හඳුන්වා දෙනු ලැබූ පැරිස් සමුළුව ඇති කරගත් ප්‍රඥප්තීන් තුළ කටයුතු කරමින්, ප්‍රධාන ලෙසම, අපිට අවශ්‍ය මූලික වෙනස්කම් සමග රටේ පරිවර්තනීය යුගය සියලු අංශවල වෙනස්කම් කිරීමටයි අපි බලාපොරොත්තු වෙන්නේ. උගත් තරුණ පරපුර වෙනුවෙන්, දැනුම පාදක කරගත් ආර්ථික සංවර්ධන සහ ආර්ථික ප්‍රතිපත්ති සමග නව උත්පාදන ආර්ථිකය, ඒ වගේම හරිත ආර්ථිකය සමග නව සැලසුම් ශ්‍රී ලාංකීය සමාජය තුළ ඉලක්ක කරගත් ජාතික සංවර්ධනයේ ප්‍රමුඛතාවයන් බවට පත් කිරීමට මා කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වගේම, නෝනාවරුනි, මහත්වරුනි, මිත්‍රවරුනි, අපේ රට දූපත් රාජ්‍යයක් විදිහට සාගර සම්පත මුල් කරගත්, සාගර සම්පතෙන් අපිට උපයා ගතහැකි සියලු සම්පත් දායාදයන්වලට ප්‍රමුඛතාවය දෙමින්, සංචාරක ව්‍යාපාරය, ධීවර කර්මාන්තය, පර්යේෂණ මුල් කරගත් වැඩ පිළිවෙළක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමයි මූලික වශයෙන් වර්තමාන නව රජයේ බලාපොරොත්තුව බවට පත්වී තිබෙන්නේ. රටේ නිදහස් සෞඛ්‍ය සේවාව, නිදහස් අධ්‍යාපනය, නව දැනුම තුළ, ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික සංවර්ධනය, දේශීය කර්මාන්ත සහ දේශීය කාර්මීකරණය තුළ මූලික වශයෙන්ම ජනතාවට වැඩි පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීම අපේ රජයේ අරමුණක් බවට පත්වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අද ලෝකයේ බොහෝ රාජ්‍යයන්හි අන්තර්ජාතික වශයෙන් අපි දකින මුහුණුවරයන් තුළ, යුද්ධයේ යුද ස්වාභාවයත්, ඇතැම් විට ඉතාමත් ම්ලේච්ඡ තත්ත්වයත්, අසමගිය, ද්වේෂය, වෛරය මුහුකුරා ගිය සමාජයන් අපිට දකින්නට තිබෙනවා. එහිදී, මානව සමජයට අවශ්‍ය ශිෂ්ටත්වය බරපතල ප්‍රශ්නයක් වී තිබෙනවා. සමාජයේ අද ඇතිවී තිබෙන බොහෝ ගැටුම්වලට, ශිෂ්ටත්වය මුල් කරගත් ප්‍රජාවක් බිහි කිරීමේ කාර්යයට, සැම රාජ්‍යක්ම මූලිකත්වය දිය යුතුයි කියා මා විශ්වාස කරනවා. ශ්‍රී ලංකාව බෞද්ධ රටක් විදිහට, ථෙරවාදී බෞද්ධ දර්ශනය තුළ පෙන්නුම් කරන දර්ශනයත් ලෝකයේ බොහෝ ප්‍රශ්න විසඳීම සඳහා ඉතා වැදගත් කියා මා විශ්වාස කරනවා. ඒ වගේම ක්‍රිස්තියානි ධර්මය, ඉස්ලාම් ධර්මය, ඒ වගේම හින්දු ධර්මය සහ අනෙකුත් ආගමික, ආධ්‍යාත්මික දර්ශනයන් වඩ වඩා පුළුල් කිරීම සහ ඒ සඳහා සියලු රාජ්‍යයන්හි ආශිර්වාදය අවශ්‍ය යුගයක් ලෙසයි මා දකින්නේ.

මේ අවශ්‍ය වෙනස්කම් රටවල් තුළ කිරීමේදී, ශ්‍රී ලංකාව වගේම ලෝකයේ බොහෝ රාජ්‍යයන් මුහුණ දී තිබෙන බරපතල ප්‍රශ්නයක් පිළිබඳව ගෞරවනීය එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේ අවධානය යොමු කිරීමට මා කැමතියි. ඒ තමයි, මුළු මහත් මානව සමාජයේ

පාසල් දරුවන් ප්‍රමුඛව දැඩි ව්‍යසනයකට, ඛේදවාචකයකට ලක්වී තිබෙන මත් ද්‍රව්‍ය පිළිබඳව ප්‍රශ්නය. මේ සමුළුව ඊයේ ආරම්භ කළ අවස්ථාවේ, පළමු දේශනය කළ බ්‍රසීල ජනාධිපතිතුමා මේ පිළිබඳව කරුණු පැහැදිලි කළා. එතුමාගේ අදහස්වලට මගේද එකඟතාවය පළ කරමින්, සමාජමය වශයෙන්, නව පරපුර, පාසල් දරුවන් ප්‍රමුඛ සියලු මිනිසාගේ බරපතල ඛේදවාචකයකට මුහුණ දී තිබෙන මේ මත්ද්‍රව්‍ය පිළිබඳ උවදුර, ජාත්‍යන්තර වශයෙන්, ඒ වගේම ජාතික වශයෙන් සෑම රටකම, ඉවත් කිරීම, මර්දනය සහ පාලනය සඳහා එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේ අවධානය යොමු කරමින්, ජාත්‍යන්තර වැඩ පිළිවෙළක දැනට වඩා විධිමත්, ශක්තිමත් භාවයක අවශ්‍යතාවය අපි දකිනවා.

ඒ වගේම, අපි සෑමවිටම කටයුතු කිරීමේදී, මේ කරුණුවලට මූලිකත්වය දීම අන්තර්ජාතික වශයෙන් අවශ්‍ය වගේම, ජාතික වශයෙන් කෙරෙන කටයුතු තුළ, මගේ රජය ශ්‍රී ලංකාවේ තිබෙන තොරතුරු ඔබ දන්නා පිරිසක් නිසා, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස සහ යහපාලනය, නීතියේ ආධිපත්‍යය සහතික කිරීමට අවශ්‍ය බොහෝ පියවර ගණනාවක්, ඒ තුළ සුභවාදී අවශ්‍ය පරිවර්තනයක් තුළින් ජාතික සංහිඳියාව ශක්තිමත් කරමින්, යුද්ධයක් නැවත අපේ රටේ, මගේ රටේ, ඇතිවීම වැළැක්වීම සඳහා සියලු පියවර මේ වන විට ගෙන තිබෙන බව ඉතාමත් සතුටින් පැහැදිලි කිරීමට පුළුවන්. මෙහිදී, මූලික වශයෙන්, ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීමේදී, ම්ලේච්ඡ ත්‍රස්තවාදීන්ගේ යුද්ධයකට වසර 30 කට ආසන්න කාලයක් මුහුණ දුන් රටක් විදිහට, ඒ තුළ ලබාගත් අත්දැකීම් සමග, නැවත කිසිදු අවස්ථාවක, මගේ රටේ, ශ්‍රී ලංකාවේ, යුද්ධයක් ඇතිවීම වැළැක්වීමත්, රට තුළ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමත්, ජාතික සංහිඳියාව තුළ ශක්තිමත් පදනමකින් ජාතීන් අතර සමගිය ඇති කරමින්, ඉතා ප්‍රබුද්ධ රාජ්‍යයක් බවට පත් කිරීමත්, මේ සඳහා මූලිකත්වය දීලා තිබෙනවා. ඒ සඳහා සෑමවිටම, ලෝකයේ සියලු රාජ්‍යයන්හි සහ, අන්තර්ජාතික සංවිධානවල ආශීර්වාදය සහ සහයෝගය මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම, ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරමින්, ජාතික සංහිඳියා පිළිවෙත ශක්තිමත් කිරීමේදීත් හඳුන්වා දෙන නව දේශපාලන ප්‍රතිසංස්කරණවලදීත්, සෑමවිටම අපි, මගේ රට වගේම, ලෝකයේ සෑම රටකටම, ලෝකයේ සෑම ජාතියකටම අනන්‍ය වූ, ඒ රටේ ජනතාවට ප්‍රධාන වශයෙන්ම අත්‍යවශ්‍ය වූ, ස්වදේශිකවාදී චින්තනයක්, ස්වදේශිකවාදී දැක්මක් තුළින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ගමනක් සඳහා ඒ අදාල හරයන් ප්‍රමුඛ වූ, අවශ්‍ය ප්‍රතිසංස්කරණ සමග යෑමේදී, ජාත්‍යන්තර සහයෝගය, ජාත්‍යන්තර මතවාදය හා ඒ එක්ව සෑමවිටම අන්තර්ජාතික සාමූහිකත්වය, සහයෝගිතාවය තුළ මානව සමාජයේ ප්‍රබුද්ධ සමාජයක් ගොඩ නගන රටක් විදිහට මගේ රට ගොඩනැගීමයි ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වෙන්නේ. අවුරුදු 30 කට ආසන්න යුද්ධයක පැටලී සිටි අපි, සෑමවිටම, ජාතික සංහිඳියාව ශක්තිමත් කරමින් එම යන ගමනේදී ඉතාමත් ප්‍රඥාවන්ත, ප්‍රබුද්ධ, බුද්ධිමත් දේශපාලන ගමනක්

ඉවසීමෙන්, සන්සුන්ව යෑම සඳහා, මගේ උතුම් ශ්‍රී ලංකාද්වීපය, මාතෘ භූමිය බලාපොරොත්තු වන ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා ඔබ සියලු දෙනාගේම සහයෝගය සහ ආශිර්වාදය මා ඉල්ලා සිටිනවා.

මූලික වශයෙන්ම, එක්සත් ජාතීන්ගේ සංවිධානය, මහ ලේකම් බෑන් කී-මූන් මැතිතුමා ඇතුළු විධායක සභාව ශ්‍රී ලංකාවට සෑම විටම දෙන සහයෝගය මා ඉතාමත්ම අගය කරනවා. බෑන් කී-මූන් මැතිතුමා මහ ලේකම් තුමා විදිහට පසුගිය කාල සීමාව තුළ ඉටු කරන ලද අන්තර්ජාතික සේවාව, මුළු මහත් මානව ප්‍රජාවට, ඒ වගේම සංහිඳියා පිළිවෙත ශක්තිමත් කිරීමට, මුළු මහත් ලෝකයට අවශ්‍ය, මානව සමාජයට අවශ්‍ය මුළු සංවර්ධන ක්‍රියාදාමයන් ඉෂ්ට කිරීම සඳහා එතුමා කළ සේවය මා ඉතාමත්ම අගය කරනවා.

ඒ නිසා, අවසාන වශයෙන්, මගේ රට, ශ්‍රී ලංකාද්වීපය, ලෝකයේ ප්‍රබුද්ධ රාජ්‍යයක් බවට පත් කිරීම සඳහා නව පරපුරට, නව දැක්මෙන් සන්නද්ධව, සෑමවිටම අපි ගෙනයන්නා වූ වැඩපිළිවෙළේදී, අපි ලෝකයේ සෑම රටකම ආදර්ශමත්, නිදහස්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනගමින්, මගේ රජයේ වගකීම සෑමවිටම ඉටු කරන බව ප්‍රකාශ කරන අතර, අවසාන වශයෙන් ඔබ සියලු දෙනාගේම සහයෝගය සහ ආශීර්වාදය ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තූතියි.

තෙරුවන් සරණයි!